# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ
## සමුපකාර සංවර්ධන නිලධාරී III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ
## විවෘත තරග විභාගය - 2018

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන නිලධාරි තනතුරේ IIIශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් සබරගමුව පළාතේ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පුරප්පාඩු සංඛ්‍යාව 17 ක් වන අතර, ඉදිරියේදී වසර 02ක් සඳහා ඇතිවන පුරප්පාඩු ද මෙම විභාගයේ ප්‍රතිඵල අනුව සම්පූර්ණ කරනු ලැබේ.

03. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය:- 2018 අගෝස්තු මස 15 වන දින

04. 4.1 **පොදු සුදුසුකම්**

(අ) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ආ) විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුය.

(ඇ) 2018.08.15 දිනට අයදුම්කරු සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචි අයෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03ක් තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(ඈ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 18ට නොඅඩු සහ 30ට නොවැඩි විය යුතුය.

4.2 **අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්**

| **අධ්‍යාපන සුදුසුකම්** | | **වෘත්තීය සුදුසුකම්** |
|---|---|---|
| **අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම්** | **අ.පො.ස.(උ.පෙළ)සුදුසුකම්** | |
| සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ වෙනත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.<br>● සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව යන්නෙන් අර්ථ නිරූපණය වන්නේ, "මවුබස" යන්න වේ. | ආර්ථික විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය, ගණකාධිකරණය, ව්‍යාපාර සංඛ්‍යානය, ව්‍යාපාර අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයයක් හෝ ඇතුළුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.) | ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ගණකාධිකරණ හෝ විගණන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමත් වී තිබීම<br>හෝ,<br>ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අවසාන අදියර සමත් වී තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම<br>හෝ,<br>පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය හෝ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත් වී තිබීම. |

05. **මෙම තනතුරට අයත් වැටුප් පරිමාණය :-**

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MN 3-2016 වන අතර, මාසික වැටුප් පරිමාණය රු. 31,040 -10 x 445- 11 x 660- 10 x 730- 10 x 750 -57,550 වේ. එහි උපලේඛන II අනුව වැටුප් ගෙවනු ලැබේ.

06. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.එසේ වුවද ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුවේ.

07. **බඳවා ගැනීමේ ක්‍රමය :-**

පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති විට ලිඛිත විභාගයක ප්‍රතිඵල මත රා.පරි.චක්‍රලේඛ 15/90 විධිවිධානයන් පරිදි දිස්ත්‍රික් ජනගහන අනුපාතය මත දිස්ත්‍රික් දෙකෙහි ඉහළම කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි.

**විභාගයේ විෂය නිර්දේශය:-**

(01) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01යි. ලකුණු 100යි.

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවයන්ද, විශ්ලේෂණ හැකියාවන්ද, තීරණ ගැනීමේ ශක්තීන්ද විනිශ්චය කිරීම සඳහා බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීම් ප්‍රශ්න 50කින් සමන්විතය.

(02) සාමාන්‍ය දැනීම - කාලය පැය 01යි ලකුණු 100යි.

පහත කරුණු ආශ්‍රයෙන් බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 50කින් සමන්විතය.

(අ) ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික හා දේශපාලන දැනුම

(ආ) සමුපකාර දර්ශනය හා ව්‍යාපාර පිළිබඳ දැනුම

මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව විභාගය පවත්වන නගරය තීරණය කරනු ලැබේ. විභාගයේදී අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ. පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රමාණවත් අයදුම්පත්‍ර සංඛ්‍යාවක් නොලැබුණහොත් විභාගයක් පැවැත්වීම ගැන සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

08. **අයදුම් කිරීමේ ක්‍රමය**

8.1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව A-4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් අනු අංක 01 සිට 04 දක්වා ඡේදයන් පළමුවන පිටුවටද අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ පිළියෙල කරගත් අයදුම්පත්‍රය තම අත් අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.2 විභාග ගාස්තුව රු. 600/-කි. මෙම විභාග ගාස්තුව සබගරමුව පළාත් සභාවේ 20.03.02.99 දරන ආදායම් ශීර්ෂයට බැරවන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුවේ. (කුවිතාන්සියේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) ගෙවන ලද විභාග ගාස්තුව කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ. ඉහත සඳහන් ආයතනවලට හැර වෙනත් කාර්යාලවලට (තැපැල් කාර්යාල, බැංකු) මුදල් ගෙවන ලද කුවිතාන්සි භාරගනු නොලැබේ.

8.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු, වාර්ෂික වැටුප රු. 240,360/- ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතුය.

8.4 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.08.15 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් **ලේකම්, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, නවනගරය, රත්නපුර** යන ලිපිනයට එවිය යුතුය.

8.5 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය -2018"** යන්න හා ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, තනතුරට අදාළ සුදුසුකම් සපුරා නොමැති සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.0 අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වන්නේය. එසේම මෙම බඳවා ගැනීමේ නිවේදනය අනුව පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම මෙම කොමිෂන් සභාව සතුවේ.

**සුනේත්‍රා ගුණවර්ධන**
**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**සබරගමුව පළාත.**

**2018.07.16 දින**
**සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන්**
**සභා කාර්යාලය,**
**සබරගමුව පළාත් සභා සංකීර්ණය,**
**නවනගරය, රත්නපුර.**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

# ආදර්ශ අයදුම් පත්‍රය

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන නිලධාරී III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල - 1
දෙමළ - 2

1.0 1.1 මුල'කුරු අගට යොදා මුල' කුරු සමඟ නම : ..........................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA, A.B.C

1.2 සම්පූර්ණ නම : ..........................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම : ..........................................
( සිංහලෙන් / දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐

1.5 දුරකථන අංකය ☐☐☐☐☐☐☐☐☐☐

2.0 2.1 ස්ථිර ලිපිනය : ..........................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................

2.2 ස්ථිර ලිපිනය : ..........................................
( සිංහලෙන් / දෙමළෙන්) : ..........................................
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

3.0 3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය: රත්නපුර ☐ කෑගල්ල ☐
(කොටුව තුළ ✓ ලකුණ යොදන්න)

3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..........................................

3.3 පදිංචිව සිටින කාලසීමාව : ..........................................

3.4 ග්‍රාම නිලධාරී කොට්ඨාසය : ..........................................

4.0 4.1 ස්ත්‍රී/ පුරුෂ භාවය ස්ත්‍රී - 1 ☐ (කොටුව තුළ අදාළ අංකය ලියන්න)
පුරුෂ - 0

4.2 උපන්දිනය: වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

4.3 2018.08.15 වන දිනට වයස: අවුරුදු ☐☐☐☐ මාස ☐☐ දින ☐☐

5.0 **අධ්‍යාපන සුදුසුකම්**

5.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් ඇමිණිය යුතුය.)
වර්ෂය:- ....................විභාග අංකය : ..........................

| අනු අංකය | විෂයය | සාමාර්ථය | අනු අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 01 | | | 06 | | |
| 02 | | | 07 | | |
| 03 | | | 08 | | |
| 04 | | | 09 | | |
| 05 | | | 10 | | |

5.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් ඇමිණිය යුතුය.)
වර්ෂය:- ....................විභාග අංකය : ..........................

| අනු අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |

5.3 වෘත්තීය සුදුසුකම් (පාඨමාලා සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය)

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාලසීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|---|
| | | | | |

(මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

6.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?
( අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් ☐ නැත ☐

7.0 ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර
(i) ගාස්තු ගෙවූ කාර්යාලය :..........................................
(ii) ලදුපතේ අංකය හා දිනය :..........................................
(iii) ගෙවූ මුදල :..........................................

**ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න**
**( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)**

8.0 අයදුම්කරුගේ සහතිකය
(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ /හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.
(ආ) මවිසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.
(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.
(ඈ) සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.............................................. ..............................................
දිනය අයදුම්කරුගේ අත්සන

9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම. (අනවශ්‍ය වචන කපා හරින්න)
මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන.......................................... මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු / ඇය මා ඉදිරිපිට දී .......................... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

.............................................. ..............................................
දිනය සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ
සම්පූර්ණ නම :..........................................
තනතුර :..........................................
ලිපිනය :..........................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)
දිනය :..........................................

(මෙම සහතිකය රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරීවරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, රු. 240,360/- වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.)

**රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා**
**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අනවශ්‍ය වචන කපා හරින්න)**

..........................................................................................මයා/මිය/
මෙනවිය දැනට ..........................................................................................
.......................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .......................... වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

දිනය :.......................................... ..............................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)